# ලාංකික වාරිකාර්මික සමාජයේ, වාරි කළමණාකරණය හා රාජ්‍ය පාලනය අතර පැවති අන්තර් පරායත්තතාව පිළිබඳ විවේචනාත්මක විමසුමක්

එම්. ජී. එම්. රෂාක්

## 1. හැඳින්වීම


ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 13 වන සියවස දක්වා වූ වසර 1,500 ක් තරම් වූ කාල පරිච්ඡේදයේ ලංකාවේ ගොඩනැංවුණු වාරි කර්මාන්ත ක්‍රම පද්ධතීන් එම සමාජයේ ආර්ථික, සංස්කෘතික හා දේශපාලන ක්ෂේත්‍රයන්හි කල බලපෑම නිසා එම යුගය වාරිකාර්මික ශිෂ්ඨාචාරයක් ලෙස බොහෝ විට හඳුන්වනු ලබයි.

මෙම ලිපියෙන් අරමුණ කොට ඇත්තේ එම වාරිකාර්මික සමාජයෙහි ක්‍රියාත්මකවූ වාරි කළමණාකරණ රටාවන් හා රාජ්‍ය පාලනය අතර තිබූ අන්‍යොන්‍ය සම්බන්ධතාව සොයා බැලීමයි. මේ සඳහා මූලික වශයෙන් වාරි කාර්මික සමාජ පිළිබඳ කාල් විට්වෝගල් (Karl Witivogel) ඉදිරිපත් කළ විග්‍රහය කෙටියෙන් විමර්ශනය කරනු ලබන අතර ඒ කරුණු පදනම් කොට ගෙන අනෙකුත් විද්වතුන් ඉදිරිපත් කොට ඇති අදහස් අනුසාරයෙන් ඉහත කී ප්‍රස්තුතය විවේචනාත්මකව සොයා බැලීමට තැත්කර ඇත.

කාර්මික විප්ලවය යුරෝපීය සමාජයෙහි ඇති කළ වෙනස්කම් සොයා බැලීම සඳහා සම්භාව්‍ය (classical) සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කළ න්‍යායන් හා සංකල්ප යුරෝපීය සමාජ ක්‍රමයන්ට වඩා වෙනස් බොහෝ සෙයින් සංකීර්ණ වූ පෙරදිග සමාජ අධ්‍යයනයෙහිලා ප්‍රමාණවත් පිටුවහලක් නොසපයයි.

එහෙත් මාක්ස්වාදී සමාජ විද්‍යාඥයෙකු වූ විට්වෝගල් චීන සමාජයේ වාරි කර්මාන්තය මුල්කොට ගත් ආර්ථික රටාව පාදක කොට ගෙන ආසියාතික සමාජවල ''ජලය'' ආර්ථික, සමාජ හා දේශපාලනික හැඩගැසීම්වල මුල් කාරකයක් වූ බව පෙන්වීමට ලියන ලද Oriental Dispotism නම් ග්‍රන්ථය එවැනි සමාජ හැදෑරීමට ගැලපෙන මූලික ක්‍රමවේදී එළඹුමක් ඉදිරිපත් කරයි. ''පෙරදිග ඒකාධිපතිත්වය'' පිළිබඳ අදහස ඔහු ඉදිරිපත් කරන්නේ මෙවැනි සමාජවල පවතින සංකීර්ණ තත්ත්වය න්‍යායාත්මක රාමුවක් තුළ ගෙනු කිරීමටයි.

සමාජ විකාශනය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන මැක්ස් වෙබර් (Maxweber) නම් සමාජ විද්‍යාඥයා මානව සමාජයේ සංවර්ධනය ''අභිචාර වලින් මිදී තාර්කීකරණය වූ නීතිමය අවධියක් කරා ගමන් කිරීම'' බව සඳහන් කරයි. යම් සමාජයක දියුණු නිලබල රාමුවක් (Bureaucracy) ගොඩනැගෙන්නේ තාර්කීකරණයේ උපරිම අවධියකදී ය. එසේ නම් සාම්ප්‍රදායික ආධිපත්‍යයක් ඇති රජු මුල්කොට ගත් සමාජයක දියුණු සමාජයක පවතින නිලබල ව්‍යුහයක් පවතින්නේ කෙසේ ද ? සාම්ප්‍රදායික පාලනයක් හා තාර්කික පරිපාලන ක්‍රමයක් යන විකල්ප ලක්ෂණ එකම සමාජ ක්‍රමයක පැවතිය හැක්කේ කුමන සාධක මුල් කොටගෙන ද? යන්න ඔහුගේ ''පෙරදිග ඒකාධිපතිත්වය'' සංකල්පයේ විග්‍රාහාත්මක ගැටළුව විය.




සමාජ විකාශන ක්‍රියාවලිය


චීනයේ මහා පරිමාණ වශයෙන් ව්‍යාප්ත ව පැවති වාරි කර්මාන්තය පදනම් කොටගත් ආර්ථිකය තම ආනුභාවික අධ්‍යයනය සඳහා තෝරාගත් විට්වෝගල් එහි දී තම විශ්ලේෂණය එක්තරා භූගෝල විද්‍යාත්මක සාධකයක් මත ව්‍යාප්ත කරයි. රටේ විශාල ප්‍රදේශයක් ශුෂ්ක දේශගුණයක් වූ හෙයින් කෘෂිකර්මාන්තය දියුණු කිරීමේ දී සීමිත සම්පතක් වූ ''ජලය'' විධිමත් ක්‍රමයක් මත බෙදහැරීම අත්‍යාවශ්‍ය වේ. ශුෂ්ක ප්‍රදේශවලට ජලය බෙදහැරීම මේ දී වර්ෂාවෙන් ලැබෙන ජලය එක්රැස් කරගැනීමත් වරින් වර ඒවා බෙද හැරීම, නඩත්තුව හා ප්‍රතිසංස්කරණය සඳහා දියුණු වාරි පරිපාලන ක්‍රමයක් අවශ්‍ය වූ බව සඳහන් කරයි.

චීනයේ ක්‍රියාත්මක වූ ''මැන්ඩරින්'' නැමැති පරිපාලන ව්‍යුහය තම තර්කය සනාථ කිරීමට උදාහරණ වශයෙන් යොදාගෙන ඇත. මධ්‍යගත වූ පාලන තන්ත්‍රයක් අවශ්‍ය වන්නේ එම පරිපාලනය වඩාත් විධිමත් කිරීමට බව සඳහන් කරයි. මෙම ප්‍රායෝගික කරුණු පාදක කොටගෙන වාරි කාර්මික සමාජ පැවැත්ම, පහත දැක්වෙන උපකල්පනයන් මත විමසුමට ලක් කරයි.

(1) වාරි කර්මාන්තය මත ආර්ථිකයක් ගොඩනැංවී තිබේ නම් එවන් සමාජයක ඉඩම් අයිතිය හෝ වෙනත් හිමිකමකට වඩා ''ජලය'' අත්‍යාවශ්‍ය ආර්ථික සාධකයක් වේ. ඒ නිසා ජලය බෙදහැරීම, පාලනය, ඉතිරිකිරීම හා නඩත්තුව සඳහා විධිමත් පරිපාලන පද්ධතියක් අවශ්‍ය වේ.

(3) කෘෂිකර්මාන්තය ප්‍රධාන ආර්ථිකය වූ විටෙක විශාල භූමිභාගයක් පාලනය කොට ගැනීමට අවශ්‍ය වන වාරි කර්මාන්තය සඳහා ශ්‍රමය, සේවා සහ අනෙකුත් සම්පත් ලබාගැනීම සඳහා මධ්‍යගත වූ ඒකීය රාජ්‍ය බලයක් අවශ්‍ය වේ.

(3) ඉහත කී පළමු හා දෙවන උපකල්පන දෙක අතර පවතින අවියෝජනීය සම්බන්ධතාවය විධිමත් වාරි පරිපාලනයකට මධ්‍යගත පාලන බලයක් අවශ්‍ය වීම මෙන්ම මධ්‍යගත පාලන බලයක පැවැත්ම සඳහා ව්‍යාප්ත වූ වාරි පරිපාලන රටාවක් අවශ්‍ය වීම.



## 2. ලාංකීය වාරි – සමාජයේ ස්වරූපය


ලංකාවේ ඉතිහාසය පුළුල් වශයෙන් පුරාතන, මධ්‍යතන සහ නූතන වශයෙන් යුග තුනක් ලෙස ඉතිහාසඥයින් විසින් බෙද දක්වා ඇත. ලාංකීය ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම යුගය ලෙස හඳුන්වන ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 13 වන සියවස දක්වා වූ මධ්‍යතන යුගය වාරි කාර්මික සමාජයක් (Hydraulic Society) ලෙස සමාජ විද්‍යාඥයින් හඳුන්වා දෙති. වාරි කර්මාන්තය මුල් කොට ගෙන උතුරු හා නැගෙනහිර කලාපවල ජනාවාස බිහිවීම, සිංහල ශිෂ්ඨාචාරය හා සංස්කෘතිය ඒ මත දියුණුවීමක් දක්නට ලැබෙන්නේ මේ යුගයේ දී ය.

ලංකාවේ ශුෂ්ක කලාපය ලෙස සැලකෙන (බටහිර දැදුරුඔය සහ දකුණු-වලවේ ගඟ) ප්‍රදේශයේ වාර්ෂික වර්ෂාපතනය අඟල් 50-75 පමණකි. මාස තුනකට පමණ සීමා වූ එම වර්ෂා ජලය ස්ථිර කෘෂිකර්මාන්තයක් සඳහා ප්‍රමාණවත් නොවේ. මෙම භූගෝලීය සාධකය හේතුකොට ගෙන ලංකාවේ රාජ්‍ය බලය හැමවිටම ප්‍රධාන ගංගා ආශ්‍රිත කොටගත් වාරි ක්‍රම ගොඩනැංවීම තම රාජ්‍ය පාලන පැවැත්ම තහවුරු කොට ගැනීමේ ක්‍රමෝපායක් වශයෙන් යොදගත් බව පැහැදිලි වෙයි.

සමස්ථයක් වශයෙන් මෙම වසර 1,500 ක් තුළ ඉදිවුණු විවිධ පරිමාණ වූ වාරිමාර්ග පද්ධතීන් වෙයි. යම් සුවිශේෂ කාලපරිච්ඡේදයකට විශේෂ වූ වාරි පද්ධතීන් මේවා යයි වර්ග කර දැක්වීම අපහසු අතර පොදුවේ ප්‍රධාන වාරි ක්‍රම තුනකට බෙද දැක්විය හැක.

1. මහා පරිමාණ වාරිමාර්ග ක්‍රම
2. මධ්‍ය පරිමාණ වාරිමාර්ග ක්‍රම
3. ග්‍රාමීය මට්ටමේ (සුළු පරිමාණ) වාරිමාර්ග ක්‍රම වශයෙනි.

ලංකාවේ වාරි කාර්මික සංවර්ධනය ක් වූ ක්‍රි.පූ. 3 වන සියවසේ සිට දක්නට ලැබුණ ද, වාරිමාර්ග පද්ධතීන්ගේ වර්ධනය දක්නට ලැබෙන්නේ පස්වන සියවසෙන් පසුවය. මෙසේ වාරි ජල ක්‍රමයන්හි සංකීර්ණ බව වැඩිවත්ම තාක්ෂණික දියුණුවත්, ඉංජිනේරුවන්, නිර්මාණ ශිල්පීන්ගේ බිහිවීමත් සමඟ මධ්‍යගත රාජ්‍ය පාලනයක වැදගත්කම ද වැඩිවෙයි. වෙනත්



වචන වලින් කිවහොත්, වාරි කාර්මික සමාජයේ වර්ධනයත් සමඟම විශේෂිත වූ ශ්‍රම විභාජනයක් ද අවශ්‍ය වන්නේ ය. මේ අනුව මධ්‍යගත රාජ්‍යයක් සහ මහා පරිමාණ ජල සම්පාදනය පහත දැක්වෙන අයුරින් අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වන අතර, පරිපාලන ව්‍යුහය ද ඒ මත පදනම් වන්නේ ය.

මහා පරිමාණ වාරි පද්ධති බිහිවීම දැඩි මධ්‍යගත රාජ්‍ය බලයක අවශ්‍යතාව මතුකරන අතර එම බලය පවත්වා ගෙන යාම සඳහා වාරි කළමණාකරණ ව්‍යුහයක් ද අවශ්‍ය විය. වාරි කළමණාකරණය පිරිහී ගිය හැමවිටම රාජ්‍ය බලය ද දුර්වල වූ බව ඉතිහාසඥයින් විසින් පෙන්වා දී ඇත.

මධ්‍ය පරිමාණ ජල සම්පාදන ක්‍රම ප්‍රාදේශීය පාලනයත් සමග සම්බන්ධව පැවැති අතර ඒවා පරිපාලනය සුවිශේෂ ප්‍රභූන් විසින් පවත්වාගෙන ගිය බව විශ්වාස කළ හැක. විශේෂ යෙන් ලංකා ඉතිහාසයෙහි ප්‍රාදේශීය පාලනය මධ්‍ය රජයට වඩා ශක්තිමත් වූ අවස්ථා වලදී එය පාදක කොටගත් දියුණු වාරි පද්ධති රටාවක් ද පැවතිණි. නිදසුනක් වශයෙන් රුහුණු ප්‍රාදේශීය පාලනය අනුරාධපුර මධ්‍ය රජයට යම් බලපෑමක් ඇති කිරීමට සමත් වූයේ රුහුණෙහි දීඝවාපිය ආශ්‍රිතව සංවර්ධිත වාරි කෘෂි ආර්ථිකයක් එහි පැවතීම හේතුකොට ගෙන ය.

සුළු පරිමාණ වාරි ජල සම්පාදනය ලාංකික වාරි කෘෂිකර්මාන්තයේ වැදගත් අංශයක්වූ බව Leach වැනි නූතන සමාජ මානව විද්‍යාඥයින් පෙන්වා දෙයි. කුඩා ග්‍රාමීය වැව් මුල්කොට ගත් යැපුම් ආර්ථිකය රටේ ග්‍රාමීය බහු ජනතාවගේ ජීවනෝපාය වූ බව දක්වයි. මෙම ග්‍රාමීය වැව් නඩත්තුව හෝ පිරිසිදුකිරීම් යනාදිය සඳහා මධ්‍යගත රජයේ හෝ ප්‍රාදේශීය පාලනයේ මැදිහත්වීමක් නොවී ය. ඒ වෙනුවට ගැමියන්ගේ සාමූහික ශ්‍රමය (communal Labour) තුළින් ඒවා පවත්වා ගෙන යනු ලැබීය.

### 3. රාජ්‍ය පාලනය හා වාරිකළමණාකරණය අතර අන්තර් පරායත්තතාව:

වාරි සමාජය තුළ විට්වෝගල් දකින ආකාරයේ බලගතු රාජ්‍ය පාලකයෙකුගේ අවශ්‍ය තාවය ඇතිකරවන්නේ භූගෝලීය වශයෙන් විශාල ප්‍රදේශයක් තුළ ව්‍යාප්ත වූ වාරි ක්‍රම පද්ධති-යක් විසින් ද යන කරුණු පසුකාලීන විද්වතුන් විසින් විවිධ දෘෂ්ටීන් ඔස්සේ සොයා බලා ඇත.

මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන සඳහන් කරන පරිදි ලංකාවේ මහා පරිමාණ වාරි ක්‍රම යම් නිශ්චිත කෙටිකාලයක් තුළ ඉදිකෙරුණු ඒවා නොව, වසර 1400 ක් පමණ කාලයක් මුළුල්ලේ ගොඩ නැංවුණ වාරි කර්මාන්ත සංවර්ධන ක්‍රියාවලියක් වේ. ලාංකික ඉතිහාසයේ මූලාශ්‍ර බොහෝවිට සමකාලීන රජවරුන් අතිශයෝක්තියෙන් වර්ණනා කිරීමට උත්සාහ කොට තිබේ. එහෙත් මහා පරිමාණ ජලාශ ඉදිකිරීම් එක් රජෙකුගේ පාලන කාලය තුළ ඉදි නොවූනු බව දක්වන ගුණවර්ධන, විට්වෝගල් දකින ආකාරයේ මධ්‍යගත පාලනයක් සඳහා නිරතුරුවම මහාපරිමාණ වාරි ක්‍රම පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වූවා යැයි කිව නොහැකි බව තවදුරටත් දක්වයි.

වාරි කළමණාකරණය හා නඩත්තු කටයුතුවලදී අවශ්‍ය වූ ශ්‍රම බලය (Man Power) ලබා ගැනීමේ දී මධ්‍යගත පාලනය යටතේ පැවැති නිලධාරි තන්ත්‍රික සහාය ලැබුණාය යන විට්වෝගල් ගේ අදහස ලංකාව සම්බන්ධයෙන් එතරම් අදාල නොවේ. චීනයේ මෙන්ඩරින් (Mendarin) ක්‍රමයට වඩා නම්‍යවූ ''රාජකාරී'' ක්‍රමයක් වාරි ක්‍රම පවත්වා ගැනීමෙහි ලා අවශ්‍ය ශ්‍රමය සැපයීය. ලංකාවේ උතුරු මැද පලාතේ ''පුල් එළිය'' ගම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් කළ Leach මෙහිලා නිවැරදි ලෙස කරුණු ඉදිරිපත් කර ඇත. (ලීච්. 1961. පි. 17)

ශ්‍රම අවශ්‍යතා සපුරාගනු ලැබුවේ රජුගේ ප්‍රාදේශීය සහකරුවන් වූ දිසාවේ වැනි ප්‍රභූවරුන් මගිනි. ගැමියා වාරි කර්මාන්තයට සම්බන්ධ වූයේ ඔහු මුළුමනින් ම ඒ මත යැපෙන නිසා නොව රජුට හෝ ප්‍රභූවරයාට සේවය කිරීම **රාජකාරියක්** වූ නිසාය.

"පුල්එළිය" ගම පිළිබඳව කරුණු සෙවීමේ දී Leach මෙතෙක් අවධානයක් නොතිබුණු වැදගත් කරුණු කිහිපයක් ම අනාවරණය කරයි. ඔහු වාරි ක්‍රම නඩත්තුව ජලය බෙදහැරීම යන කරුණු වලදී "ඥාතිත්වය" ද (Kinship) වැදගත් වූ බව සඳහන් කරයි. ග්‍රාමීය ලංකාවේ බහුතර ගැමි ජනතාවගේ කෘෂිකර්මාන්තය අවශ්‍ය ජලය ලබාදෙනු ලැබුවේ මහා පරිමාණ ජලාශ වලට වඩා ග්‍රාමීය කුඩා වැව් වලින් බව සඳහන් කරන ලිච් ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්තව පැවති කුඩා වැව් වර්ග තුනක් ගැන සඳහන් කරයි.

(1) ප්‍රභූ පවුල්වලට අයත් වූ පෞද්ගලික වැව්–මෙවා ග්‍රාමීය ප්‍රභූ පවුල්වලට හිමි ඉඩම් වගාකිරීම සඳහා යොදගත් අතර ඒ සඳහා ශ්‍රමය ලබාගනු ලැබුයේ රාජකාරි මගිනි. (1833) දී කෝල්බෲක් කොමිසම මගින් මෙම ඉඩම් අයිතිය අවලංගු කිරීම නිසා එම ක්‍රමය පිරිහී ගියේය.)

(2) විහාර අධිකාරියට අයත් වැව–රාජ්‍ය තන්ත්‍රයේ මැදිහත්වීමක් දක්නට නොලැබුණු අතර බ්‍රිතාන්‍ය පාලනයත් සමඟ මෙම වාරි ක්‍රමය බිඳ වැටිනි. (මෙය පුල්එළිය ගමේ වගාවන් සඳහා ජලය ලබාගත් එක් ප්‍රධාන ක්‍රමයකි.)


(3) ඔලගම–කුඩාවැව්–මෙවා නඩත්තු කිරීමේ හෝ ප්‍රයෝජන ගැනීමේ විධිමත් ක්‍රමයක් නොපැවති අතර ගම්මුන්ගේ ජල අවශ්‍යතාවලින් වැඩි ප්‍රමාණයක් මෙවැනි වැව් වලින් ලබාගත්හ. සාමූහික ශ්‍රමය මගින් මෙවා පවත්වා ගෙන යනු ලැබීය.

ලිච් ට අනුව වාරි ජලය බෙදගැනීමේ දී මධ්‍යගත පරිපාලන ක්‍රමයක් මත යැපීමට වඩා ග්‍රාමීය මට්ටමේ ද සාමූහික හා සාධාරණ ජලය බෙදගැනීමේ පිළිවෙතක් ගම්මුන් අනුගමනය කළ බව සඳහන් කරයි.

ගමේ වැවෙන් ජලය ලබාගෙන ගොවීතැන් කළ කෙත්යායේ ඉහළ යාය සහ පහළ යාය වශයෙන් කොටස් දෙකක් විය. මේ යාය දෙකේ ඉඩම් කට්ටි අයත්ව තිබුනේ ඉහළ යායේ පලමු කට්ටිය අයිති තැනැත්තාට පහළ යායේ පහළම ඉඩම් කට්ටිය අයත් වන පරිදි ය. මේ නිසා ජලය හිඟ කාලවලදී එක් පිරිසකට අසාධාරණයක් සිදු නොවීය.

(රූප සටහන බලන්න)

ආචාර්ය පෙරේරා මෑතක දී "වැවගම' පිළිබඳ කරන ලද සමාජ විද්‍යාත්මක අධ්‍යයනයේ දී ද මේ පිළිබඳ නිවැරදි ව කරුණු ඉදිරිපත් කර ඇත. පුරාණ ගමක සමාජ හා ආර්ථික ජීවිතයේ දී "වරිගය" නම් ඥාතිත්ව සංස්ථාව සැලකිය යුතු බලපෑමක් කළබව ඔහු මෙහිදී පෙන්වා දෙයි.




As **purana** villagers wanted to keep their village lands intast and their kindred as a corporate body, they had to have a specific mechanism with which to defend themselves against the claims of outsiders over their limited but mush valued resources - paddy fields, compounds, villagc tanks etc. The institution of **variga** provided this mechanism. (P. 20)

(පුරාණ ගම් වැසියන්ට ඔවුන්ගේ ඉඩම් ඛණ්ඩනය නොවන පරිදි තබා ගැනීමටත්, තම සහෝදර ගැමියන් සමඟ සාමුහික ඒකකයන් වශයෙන් ජීවත් වීමටත් උත්සාහ ගෙන ඇත. පිටස්තර පුද්ගලයන්ගේ බලපෑම් වලින් ආරක්ෂා වීමටත් තමන් සතු සීමිත එසේම වැදගත් සම්පත් (කුඹුරු යාය, ග්‍රාමීය වැව යනාදීය) රැක ගැනීමටත් ඔවුන් අනුගමනය කළ විශේෂ යාන්ත්‍රණයක් (mechanism) විය. ඒ යාන්ත්‍රණය සපයන ලද්දේ " වරිගය " නැමති සංස්ථාව විසිනි. (පෙරේරා පිටු 20)

වාරි කළමණාකරණය ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය මූල්‍ය වියදම් හා ශ්‍රමය සඳහා කෘෂි කර්මාන්තයෙන් උපයන ලද අතිරික්තය (surplus) යොදවාගත් බව වාරි සමාජ විග්‍රහයේ දී ඉදිරිපත් වන තවත් අදහසකි. එහෙත් මෙම අතිරික්තය අයකර ගැනීමේ හෝ නැවත ආයෝජනය කිරීමේ විධිමත් ක්‍රමයක් භාවිතා නොවීය. රජු සහ ඔහුගේ ප්‍රාදේශීය පාලකයින්, නිලධාරීන් විසින් මෙම අතිරික්තය ලබාගත් බවත් එය බදු හා **සේවා** යන ආකාර දෙකකින් සිදු වූ බවත් සඳහන් කරන සිරිවිර, කුඹුරු හා හේන් ගොවිතැන් වලින් අය කළ බදු සහ වෙළඳාම හා වාරි ජලය සඳහා අය කළ බදු වශයෙන් වෙන්කොට ගත හැකි බව දක්වයි. (පිටු 36, 39, 40)

රාජකාරී ශ්‍රමයට අමතරව වැටුප් ගෙවා ලබාගත් කම්කරු ශ්‍රමයක් ද මහා පරිමාණ වාරි පද්ධති නඩත්තු හා ප්‍රතිසංස්කරණයේ දී යොදගත් බව සඳහන් කරන ලෙස්ලි ගුණවර්ධන මෙම කෘෂිකර්මාන්තයෙන් ඉපයූ අතිරික්තය සෘජුවම වාරි කර්මාන්තයට යොදගත්තා නොව, වාරි සමාජයේ දියුණු දේශීය හා විදේශීය වෙළඳාම සඳහා ද යොදගත් බව සඳහන් කරයි. කහවනු කහවනු වැනි මුදල් භාවිතයෙන් ඒ බව සනාථ වන බව දක්වන මොහු වාරි කළමණාකරණය සඳහා මූල්‍ය ආයෝජනය සඳහා වෙළඳාම තුළින් උපයන ලද ලාභ ද යොදූ බව සඳහන් කරයි.




**සමාලෝචනය:**

වාරි කළමණාකරණයේ විවිධ සංකීර්ණතා මෙන්ම එය පාදක කොටගත් රාජ්‍ය පාලනය හා සමාජ ආර්ථික ව්‍යුහයේ ද දක්නට ලැබෙන්නේ සංකීර්ණ බවකි. විට්ෆෝගල් චීනයේ ආනුභාවික නිරීක්ෂණ ආශ්‍රයෙන් කරන විග්‍රහය, ලාංකික වාරි සමාජය අධ්‍යයනයෙහි ලාසීමාකම් හා ගැටළු මතුකොට ඇත.

වාරි—ජල සම්පාදනය රාජ්‍ය තන්ත්‍රයේ ස්ථාවර බව තහවුරු කිරීමේ ක්‍රමෝපායයක් ලෙස ලංකාවේ මුල් ප්‍රධාන පාලන මධ්‍යස්ථාන දෙක වූ අනුරාධපුරය හා පොළොන්නරුව කේන්ද්‍ර කොටගත් රාජ්‍ය තන්ත්‍රය විසින් භාවිතා කොට ඇත. එහෙත් පාලන මධ්‍යස්ථානය දකුණට සංක්‍රමණය වත් ම වාරි කළමනාකරණය මෙන්ම දැඩි රාජ්‍ය බලය ද ක්‍රමයෙන් දුරවල වෙයි. දකුණු ඉන්දිය චෝල, පාණ්ඩ්‍ය, කේරළ ආක්‍රමණයන් නිසා රටේ ආර්ථික බලය වඩා දුර්වල වීමත්, නැවත ආර්ථිකය නගා සිටුවීමේ හෝ කේන්ද්‍රීය බලයක් පවත්වා ගැනීමේ හැකියාවක් පසුව බලයට පත් රජ්‍ය පාලකයන්ට නොහැකි වෙයි.

විට්වෝගල් ඉදිරිපත් කළ චීනයේ මැන්ඩරින් වැනි වාරි පරිපාලන තන්ත්‍රයට වඩා වැඩවසම් හා නම්‍ය වූ වාරි පාරිපාලන ව්‍යුහයකි ලංකාවේ පැවතියේ. මැන්ඩරින් වැනි පාලන තන්ත්‍රයක් කාලයක් තුළ වර්ධනය වීම රාජ්‍ය බලයට එරෙහිව නැගී සිටීමේ භීතිය නිසා දියුණු සම්මුඛ පරීක්ෂණ හා නීත්‍යානුකූල නිලධාරි–සේවක සම්බන්ධතාවයක් චීනයේ පැවති බව විට්වෝගල් දක්වුව ද, කුල ක්‍රමය වැනි සාම්ප්‍රදායික සමාජ ස්ථාරයන රටාව මගින් නිර්වචනය කරන ලද **රාජකාරි** ක්‍රමය ලංකාවේ වාරි පරිපාලනය තුළ උපයෝගී කොටගත් බව පසුකාලීන අධ්‍යයන වලින් පැහැදිලි වෙයි.

එසේ නම් ලාංකික වාරී සමාජයේ යථාර්ථය හඳුනාගැනීමට විට්වෝගල්ගේ විග්‍රහයට වෙනස් වූ සමාජ විද්‍යාත්මක දෘෂ්ටියක් අවශ්‍යව ඇත ? පූරාතන යුගයේ සිට මධ්‍යගත යුගය දක්වා ක්‍රමයෙන් වර්ධනය වුනු වාරිකාර්මික පද්ධතිය මගින් මධ්‍යගත බලයක පැවැත්ම තහවුරු කොට තිබුන ද ඒවා නඩත්තු කිරීමේ හා අළුත්වැඩියාව, ආදයම් එකතුකිරීම ආදී බලතල ප්‍රාදේශීය ඒකක වලට පවරා තිබූ බව මූලාශ්‍ර පරිශීලනය කිරීමේ දී පෙනී යයි. යුද්ධ කාලවලදී හා විශේෂයෙන් මහා පරිමාණ ජලාශ ඉදිකිරීමේ ව්‍යාපෘති පැවැති කාලවලදීත් මධ්‍ය ආණ්ඩුවේ බලය වඩාත් තහවුරු වී පැවතිනි.

මාක්ස්වාදී අදහසින් බලන කල ලංකාවේ වාරිකර්මය මුල්කොටගත් කෘෂිකාර්මික ව්‍යුහය සමාජ ප්‍රතිවිරෝධතා වලින් යුක්ත වූවකි. ප්‍රධාන ප්‍රතිවිරෝධතාවය පාලකයා හා ඔහුගේ ප්‍රාදේශීය පාලකයන් අතරත් අනෙක් අතින් බහු ජනතාව වූ ගැමියන් හා පාලක පක්ෂයන් අතර පැවති ප්‍රතිවිරෝධතාවයයි.

තවද ව්‍යාප්තව පැවැති කුල ක්‍රමය තුළින් සමාජය තුළ වාරි කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන ශ්‍රම විභජනයක් ද පවත්වා ගෙන යනු ලැබීය. මෙවැනි සංකීර්ණ සමාජ ව්‍යුහයක් තුළ කේන්ද්‍රීය නගර හා ග්‍රාමීය ප්‍රදේශ අතර මෙන්ම පාලක පාලිත කොටස් අතර ද සමාජ අසමානතාවයක් නිරතුරුව පැවති බව නිගමනය කළ හැක.

සංමස්ථයක් වශයෙන් බලන විට පෙරදිග සමාජ පිළිබඳ විට්වෝගල් ගේ විග්‍රහය ලාංකික වාරි සමාජය අධ්‍යයනයේ වූව විද්‍යාත්මක ප්‍රවේශයක් සපයා ඇත. එහෙත් ලාංකික වාරි කාර්මික සමාජයේ වාරි පද්ධතිය හා රාජ්‍ය පාලනය අතර අන්තර් සම්බන්ධතාවය කෙරෙහි ඓතිහාසික මූලාශ්‍ර වලින් කියැවෙන හේතු සාධකවලට වඩා බාහිරින් නිරීක්ෂණය කිරීමට අපහසු සමාජ හා මානව විද්‍යාත්මක පදනමක් පැවති බව මෙහිලා නිගමනය කිරීමට සිදුව ඇත.

---

### References


1. Leach, E. R. : Pul Eliya a village in Ceylon,Cambridge University. 1961.
2. Hydraulic Society in Ceylon. Past and Present, No. 15 April, 1969.
3. Perera, U. L. J. : *Ghange and Settlement :* A Protriat of a Sri Lanka Village. Studies on Agrarian Societies in South Asia. (6) (L.I.C.A.A.) Tokyo 1985.
4. Siriweera, W. I. : Land Tenure and Revenue in Medieval Ceylon (AD 1,000—1900) ; The Ceylon Journal of Historical and Social Studies. New Series Vol. 11 1972.
5. "Young Sociologist" : A Journal Published by the University Sociological Association, Peradeniya. 1979.